Annex III


**උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**උසස් අධ්‍යාපන අංශය**

உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு

**உயர் கல்விப் பிரிவு**

MINISTRY OF HIGHER EDUCATION & CULTURAL AFFAIRS

**HIGHER EDUCATION DIVISION**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: HE/AD/VP/GEN (Vol III) | ඔබේ අංකය / உமது இல / Your No: HE/AD/VP/2016 | දිනය / திகதி / Date: 2018.06.19 |

සභාපති

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

<u>සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංකය හා 2016.08.16 දිනැති ලිපියට අමතරව බැඳේ.

02. ඒ අනුව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක.TIP/SS/01/03 හා 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අංක.01/2018 චක්‍රලේඛය සහ 2018.06.08 දිනැති 01/2018 (I) චක්‍රලේඛය අනුව සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීම සඳහා ඔබ ආයතනය විසින් එවනු ලබන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග අනුගමනය කල යුතු බව දන්වා සිටිමි. (චක්‍ර ලේඛයේ පිටපත මේ සමඟ අමුණා ඇත.)

- මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පමණක් මෙම චක්‍රලේඛයේ ඇමුණුම III යටතේ ඉංග්‍රීසි භාෂාවෙන් ඇති අයදුම්පත්‍රය මඟින් ඉල්ලීමක් ඉදිරිපත් කල යුතුවේ.
- එමෙන්ම ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නම අයදුම්පතෙහි ඇතුලත් විය යුතු අතර, (එහි පිටපත අමුණා එවිය යුතුය) පත්වීම් ලිපිය සහ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් නම අතර වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කල යුතුවේ.
- අදාල නිලධාරියා බලපත්‍රය ඉල්ලුම් කිරීමේදී ඔහුගේ/ඇයගේ පත්වීමේ ලිපියේ ,වැඩ භාරගත් ලිපියේ හා සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.
- මීට පෙර කුමන හෝ සහනදායි මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මෝටර් රථයක් ලබා ගෙන ඇත්නම් එය ආනයනය කිරීම සඳහා ණයවර ලිපිය විවෘත කල දින සිට/දේශීයව එකලස් කරන ලද මෝටර් රථයක් සඳහා පළමු ගෙවීම සිදු කල දින සිට වසර 05 සක්‍රිය සේවා කාලයක් හිමි නිලධාරීන්ගේ අවසන් වරට බදු සහන යටතේ ලබා ගත් මෝටර් රථයේ ණයවර ලිපියේ සහතික කල පිටපතක් සහ එහි ලියාපදිංචි කළ සහතිකයේ සහතික කළ පිටපතක්/දේශීයව එකලස් කරන ලද මෝටර් රථයේ ගෙවීම සිදුකල රිසිට්පතෙහි සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනය වන විට සහනදායි මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මීට පෙර මෝටර් රථයක් ලබාගෙන ඇත්නම් එහි ණයවර ලිපිය විවෘත කල දින සිට වසර පහක (05) ඉක්මවා ඇති බවට අදාල අයදුම්කරු විසින් ගෞරව බහුමාන සහතිකයක් ඉදිරිපත් කල යුතුය.
- මේ සමඟ අමුණා ඇති (ඇමුණුම 01) පිරික්සුම් ලේඛනය (Check list) නිසි පරිදි සම්පූර්ණ කර අයදුම්පත සමඟ එවිය යුතුය.
- අයදුම්පතෙහි "එෆ්" කොටසෙහි 3හි සඳහන් තොරතුරු සනාථ කිරීම පිණිස නිලධාරියාගේ අදාල තනතුර/තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත් ලිපියේ සහතික කල පිටපතක් ඉදිරිපත් කල යුතුය.
- යම් හෙයකින් අදාල නිලධාරින් විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරමින් සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබාගෙන වාහනයක් ආනයනය කර ඇති බවට ඔප්පු වුවහොත් එම බලපත්‍රය අවලංගු කිරිමට සිදුවීමෙන් රජයට අයවිය යුතු සියළුම ගාස්තු එම අයදුම්කරුවන් විසින් පෞද්ගලිකව දැරිය යුතුය. ඉහත උපදෙස් ඔබ ආයතනය යටතේ ඇති සියළුම ආයතනයන්හි අදාල නිලධාරීන් වෙත දැන්වීමටත්, ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙසත් කාරුණිකව දන්වමි.

**ටී.බී.එම්. අතපත්තු**
අතිරේක ලේකම් (පාලන හා මුදල්)
ලේකම් වෙනුවට

ඇමුණුම 01

<u>සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය</u>

<u>වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක.01/2018 සහ 01/2018 (I) යටතේ සහනදායි පදනම මත මෝටර් රථ ආනයනය කිරීම සඳහා බලපත්‍රය ලබාගැනීමේ සඳහා සපුරාලිය යුතු පිරික්සුම් ලේඛනය</u>

අයදුම්පත් අංකය හා දිනය :-

අයදුම්කරුගේ නම :-

අමාත්‍යාංශය/ආයතනය :-

තනතුර :-

| | ඔව්/ඇත/නැත/අදාල නොවේ |
|---|---|
| 01.අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර ඇති බව | ................. |
| 02.අයදුම්පතෙහි ඉල්ලුම් කරන නිළධාරියාගේ අත්සන හා දිනය නිවැරදිව සටහන් කර ඇති බව | ................. |
| 03.අයදුම්පතෙහි "එෆ්" කොටස නිවරදිව සම්පූර්ණ කොට ආයතන ප්‍රධානියාගේ අත්සන, නිලමුද්‍රාව හා දිනය නිවරදිව සටහන් කර ඇති බව | ................. |
| 04.මීට පෙර බදු සහන යටතේ මෝටර් රථයක් ලබා ගෙන ඇත්නම් එහි ණයවර ලිපියේ සහතික කළ පිටපතක්/ ලියාපදංචි කල සහතිකයේ පිටපතක් / දේශීයව එකලස් කරන ලද මෝටර් රථයේ ගෙවීම සිදුකල රිසිට්පතෙහි සහතික කළ පිටපතක් අමුණා ඇති බව | ............. |
| 05.ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියකු බව | ............... |
| 06.ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විධායක ශ්‍රේණියේ නිලධාරියකු බව | ............. |
| 07. නිලධාරියා සහනදායි මෝටර් රථ බලපත්‍රය සඳහා හිමිකම් ලබන තනතුරු කිහිපයක සේවය කර ඇත්නම් එම තනතුරුවලට අදාලව සේවය තහවුරු කිරීමේ ලිපියේ පිටපත් /ස්ථිර කිරීමේ ලිපියේ පිටපත් අමුණා ඇති බව | ............... |
| 08.අයදුම්පතෙහි "එෆ්" කොටසෙහි 3හි සඳහන් තොරතුරු සනාථ කිරීම පිණිස නිලධාරියාගේ අදාල තනතුර/තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත් ලිපියේ සහතික කල පිටපතක් ඉදිරිපත් කර ඇති බව/තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර ඇතිබව/තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව සිදුකර ඇති බව | ............. |
| 09. තනතුරට අදාල වැටුප් කේතය සඳහන් කර තිබීම. | .............. |
| 10. පත්වීමේ ලිපියේ, වැඩ භාර ගැනීමේ සහ සේවය ස්ථිර කිරමේ ලිපියේ සහතික කළ පිටපත අමුණා ඇති බව | ..............<br>............... |
| 11.ජාතික හැඳුනුම්පතේ සහතික කල පිටපත අමුණා ඇතිබව | ............... |